# **භාවනායෝගී භික්ෂූන් වහන්සේලා වැඩසිටි ලෙන් විහාරාරාම පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යනයක්**

**මේනකා නිශාන්ති**

**සහකාර පුස්තකාලයාධිපති**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

කඳුබෑවුම් වල තිබෙන ගල් පර්වතයන්හි පසෙක වූ ස්වභාවික ගල්ලෙන් ආගමික කටයුතු සඳහා භාවිතා කිරීමේ ආරම්භය මානව ඉතිහාසයේ ඈත යුගය දක්වාම දිවෙන අතර ඉන්දියාවේ හා ලංකාවේ මුල් බෞද්ධ යුගයන්හි මෙය වඩාත් කැපී පෙනෙන ලක්ෂණයක් විය. ඉන්දියාවේ ක්‍රි. පු 3 වන සියවසේදී අශෝක අධිරාජ්‍යයා විසින් බිහාරයේ ගයාවට නුදුරු බර්බාර් කඳුවැටියේ ලෙන් භික්ෂූන්ට පූජාකළ බව සඳහන් වේ. එසේම ක්‍රි. පු 2 වන සියවසයේ නිර්මිත හයිදබාදයේ පිහිටි අජන්තා ලෙන් ද මීට නිදසුනක් ලෙස දැක්විය හැකිය.[1] (Alping, Mc, <u>Guide to Ritigala</u>, (පරි.) උදිත අලහකොන්, (ශ්‍රී ලංකාව : මධ්‍යම සංස්කෘතික අරමුදල, 2002), 26).

ශ්‍රී ලංකාවේ මුල්කාලීන අනුරාධපුර යුගයේ පැවති ප්‍රධාන ආගමික ජනාවාස වූයේ ස්වභාවිකව පැවති ගල්ලෙන්ය. භික්ෂූන් වහන්සේලා මේවා භාවිතා කිරීමට දැඩි කැමැත්ත දකවන ලදී. මිහිඳු හිමියන් ඇතුළු දූත පිරිසට දේවානම් පියතිස්ස රජතුමා විසින් මහා මේඝවනය (මහමෙව්නාව) පරිත්‍යාග කර පිළිගැන්වී මෙන් අනතුරුව වර්ෂා සමය ආරම්භ වන විට ආපසු මිහින්තලය වෙත පැමිණ ඇති බවට සාධක දක්නට ඇත. එසේ පැමිණ ඇත්තේ මිහින්තලයේ පැවති ලෙන් හැට අටක් භික්ෂූන් වහන්සේලාගේ ආගමික ඇදහිලි සහ භාවනාමය කටයුතු සඳහා ආවාස ලෙස සූදානම් කිරීම හේතුවෙනි.[2] (ගුණවර්ධන, ප්‍රියන්ත, **<u>පුරාවිද්‍යාවඃ ශ්‍රී ලංකාවේ බහුජාතික එකමුතුව සහ වාස්තුවිද්‍යාව</u>** ( කොළඹඃ ඇස්ගොඩගේ සහ සහෝදරයෝ, 2009), 62-63). එසේම ශ්‍රී ලාංකීය ඉතිහාසයේ ප්‍රධානවූත් , මුල්වූත් , භික්ෂූන් වහන්සේලා සඳහා පිළියෙළකළ ස්වභාවික ලෙන් විහාරාරාම සම්ප්‍රදාය බිහිවූයේ වෙස්සගිරි ලෙන් විහාරාරාම සම්ප්‍රදාය තුළිණි.[3] (ගුණවර්ධන, ප්‍රියන්ත, **<u>පුරාවිද්‍යාවඃ ශ්‍රී ලංකාවේ බහුජාතික එකමුතුව සහ වාස්තුවිද්‍යාව</u>** (කොළඹඃ ඇස්ගොඩගේ සහ සහෝදරයෝ, 2009), 63).

මිහින්තලෙන් ආරම්භ වූ මෙම ලෙන් විහාරාරාම සම්ප්‍රදාය පසු කාලීනව ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම ව්‍යාප්ත වී ඇති බවට සාධක දක්නට ඇත. එනම් වෙස්සගිරිය , සිතුල් පව්ව (චිත්තල පබ්බත), රිටිගල (අරිට්ඨ පබ්බත), රජගල හෙවත් රාස්සගල යනාදි ස්ථානයන්ය.[4] (රාහුල, වල්පොල, **<u>ලක්දිව බුදුසමයේ ඉතිහාසය</u>** (කොළඹඃ ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, 1999) 117). මීට අමතරව සීගිරිය, දඹුල්ල ආදි ස්ථානවලද ලෙන් විහාරාරාම පිහිටි බවට පුරා විද්‍යාත්මක සාධක හමු වී ඇත.

ස්වභාවික ගල්ලෙන්වල තිබූ සරල බවත් ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල මේවා විසිරී තිබීමත් මුල් කාලීන විහාරාරාම සඳහා මේවා තෝරා ගැනීමට හේතු වශයෙන් බලපාන ලදී. මෙබඳු ලෙන් විහාරාරාමවල කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ, ඒවා අති විශාල කඳුමුඳුන්වල විසිරි ඇති ගල්ලෙන් පාදක කොට ගෙන නිර්මාණය වීමත්, අනික් අතින් කඳු ශිඛරවලට වඩා ස්වභාවික පොළවේ විසිරි ඇති ගල් ලෙන් ආවාස සඳහා තෝරා ගැනීමත්ය.

ක්‍රි.පූ 3 වැනි සියවසේ සිට මහනුවර යුගයේ අවසානය දක්වා ලෙන් විහාරාරාම භික්ෂූන් ආවාස ලෙස භාවිතා කළ බව පෙනේ. ශ්‍රී ලංකාවේ ආගමික ඉතිහාසයේ කැපී පෙනෙන ලක්ෂණ සහිත ලෙන් පිහිටා තිබෙන ස්ථාන අතරින් රිටිගල (අරිට්ඨ පබ්බත) ඉතාමත් වැදගත්ය. කටාරම් සහිත ලෙන් විශාල ප්‍රමාණයක් රිටිගල කන්දේ පිහිටා ඇති අතර ඒවායින් සැලකිය යුතු ප්‍රමාණයක බ්‍රාහ්මීය ලිපි දක ගත හැකිය. ආරාම කලාපය තුල ගුහා 06ක් සහ ව්‍යුහ 50ක් බෙල් මහතා විසින් හඳුනාගෙන තිබේ.[5] (Alping, Mc, <u>Guide to Ritigala</u>, (පරි.) උදිත අලහකොන්, (ශ්‍රී ලංකාව : මධ්‍යම සංස්කෘතික අරමුදල, 2002), 38). රිටිගල අවට ලෙන් පිළිබඳව 1992 සිදුකරන ලද ගවේෂණයකදී ලෙන් 78කට වැඩි ප්‍රමාණයක් පිළිබඳව අනාවරණය කරගෙන ඇත.[6] (චන්ද්‍රානන්ද, මන්දාරම්නුවර, **<u>රිටිගල උරුමය</u>** (කර්තෘ ප්‍රකාශනයකි, 2017), 25).

අනුරාධපුරයට අමතරව රෝහණයේ වැඩ විසූ මහ රහතන් වහන්සේලා සඳහා ලෙන් විහාරාරාම සිතුල්පව්ව, මණ්ඩාගල, බඩරගස්තලාව, බෝවත්තේගල, කොටාදමු හෙල, සීලව කන්ද, බුදුබාව, නීලගිරීය, මොණරාගල, රජගල ආදිස්ථානවල පිහිටා ඇති ලෙන් දැක්විය හැකිය.[7] (මේධානන්ද, එල්ලාවල, **<u>ඓතිහාසික කුඩුම්බිගල,</u>** (කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම, 2005), 54). සිතුල්පව්ව පුරාතනයේ ප්‍රබල ආගමික මධ්‍යස්ථානයක්ව පැවතුණි. විශේෂයෙන් මෙය ලෙන් විහාරාරාම සම්ප්‍රදයේ සංඝාරාම සංකීර්ණයක් වූ බව පෙනේ. ස්වභාවික නිර්මාණය වූ ලෙන් සංඝයා වහන්සේට පරිහරණය කළ හැකි පරිදි ශුද්ධ කරවා, කටාරම් කොටවා, බිත්ති බැද සකස් කොට ඒවා පිදුවන්ගේ නම් කොටවා තැනූ බවට සාධක හමු වී ඇත.[8] (අමරසිංහ, මාලිංග, **<u>සිතුල්පව්ව විහාරය,</u>** (ඍා ඇලඃ සමගිපොත් ප්‍රකාශකයෝ, 2005), 42).

මීට අමතරව රෝහණයේ පිහිටි කුඩුම්බිගල තපෝවනය තුල එකකට එකක් මද දුරක් සිටින සේ ලෙන් සිය ගණනක් පිහිටා තිබූ බවට සාධක හමුවී ඇත. ලෙන් 105ක් පමණ පිහිටා තිබෙන බවට පුරාවිද්‍යාත්මක සාධක මඟින් අනාවරණය කරගෙන ඇත. මෙහි සෑම ගිරිකුලක් පාසාම ලෙන් එකක් හෝ කිහිපයක් පිහිටා තිබේ. මින් සමහරක් ලෙන් කටාරම් කොටා, ඒවා කරවූ දායකයන් පිළිබඳව විස්තර සහිතව බ්‍රාහ්මීය ලිපි පිහිටුවා තිබේ. ඇතැම් ලෙන්වල කටාරම් කොටා ඇතැත් ලිපි පිහිටුවා නැත. කටාරමක් නොමැති කිසිදු ලෙනක් මෙහි නොමැති වීමෙන් පෙනීයන්නේ**,** සෑම ලෙනකම අතීතයේ යෝගාචරයන් වහන්සේලා වැඩසිටි බවයි.[9] (මේධානන්ද, එල්ලාවල, **<u>ඓතිහාසික කුඩුම්බිගල,</u>** (කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම, 2005), 55).

පසුකාලීනව භික්ෂූන් වහන්සේලාගේ ආගමික පූජාවන් සඳහා සුවිසල් ආරාම ඉදිකළ පසුව පවා ගුහාවල විසීමේ සම්ප්‍රදාය පැවතුණු අතර අද ද සමහර භික්ෂූන් වහන්සේලා විසින් මෙම පුරුද්ද පවත්වාගෙන යන බව පෙනේ. එයට හේතුව කවරේද යන්න නිශ්චිතව පැවසිය නොහැක. ආරාමවල පවතින වඩාත් සුවපහසු සහ සිත වියවුල් කරන පරිසරය හේතුකොට ගෙන අවසානයේ නිශ්ක්‍රමණික සහ ආගමික හැකියාවෙන් යුත් භික්ෂූන් විනය විරෝධී සහ දූෂිත තත්ත්වයට පත්වීමට ඇති හැකියාව සහ අනෙකුත් අතට මෙම ගුහාවන් මෙම සමාජයෙන් හුදකලාව හෝ වන ගහණයෙන් වට වී නිසංසල පරිසරයක පිහිටා ඇති නිසා අත්තකිලමතානු යෝගයෙන් උපරිම හා පරිපූර්ණ ලෙස ආගමික ක්‍රියාකාරකම්වල යෙදීමට උචිත වීම මීට හේතුවන්නට ඇත.[10] (Alping,Mc, Guide to Ritigala, (පරි.) උදිත අලහකොන්, (ශ්‍රී ලංකාව : මධ්‍යම සංස්කෘතික අරමුදල, 2002), 26-27).

ගුහාවාසී භික්ෂූන්ගේ අවශ්‍යතාවයන් ඉතා සරල වන අතර ඔවුන් සිය පවිත්‍රතාවය සහ භක්තිමත් භාවය රැකගෙන ජීවත්වන හෙයින් ගිහි දායකයින් විසින් ඔවුහු අනෙකුත් භික්ෂූන්ට වඩා සත්‍ය වශයෙන්ම ආගමික හා ශුද්ධවන්ත භාවයෙන් යුක්ත වුවත් ලෙස සලකනු ලැබේ. භික්ෂූන් විසින් ගුහාව පවතින ආකාරයෙන්ම භාවිත නොකළ අතර එය ඔවුන්ගේ ආගමික නිවහන ලෙස සකසා ගත්හ. එම නිවහනට යාමට පෙර ඒවා සුදුසු පරිදි සකස් කළ යුතු වේ. මෙය පහසු කාර්යයක් නොවන අතර ක්‍රි:පූ 5 සියවසේ ගුහ සැකසීම පිළිබඳව ආචාර්ය වල්පොල රාහුල හිමි මෙසේ විස්තරකර ඇත.[11](රාහුල, වල්පොල, **ලක්දිව බුදුසමයේ ඉතිහාසය** (කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, 1999), 119).

"පළමු කොට ගල් ලෙන තුළ දර ගොඩ ගසා ගිනි තබන ලද්දේය. මෙසේ කළ විට බුරුලට තිබුණු ගල් පතුරු කඩා වැටුණේය. දුර්ගන්ධ ද නැති වී ගියේය. ලෙන පිරිසිදු කළ පසු, ආවරණ රහිත ගුහාවල ගඩොල් බිත්ති බැද ජනෙල් සවිකරන ලදී. ඇතැම් විට බිත්තිවල බදාම ගසා සුදු හුණු ගාන ලද්දේය. ඊළඟට තවුසකුට උවමනා ඇඳ පුටු ආදි සුළු සුළු ගෙබඩු ටික සපයන ලදී. භික්ෂූන් ආවාස කොටගත් ඇතැම් ගල් ලෙනවල සිතුවම් පවා ඇද තිබුණු බව සඳහන් වේ"

මේ ආකාරයට පිළියෙල කරගත් ස්ථානයක් නැතිනම් ආවාස ගෙයක් භික්ෂූන් වහන්සේලා හට සෞන්දර්යාත්මක, ශාන්ත පරිසරයක් වුවාට නිසැකය. වඩාත් ශ්‍රද්ධා සම්පන්න වූ ද උග්‍ර තවුස් වත් ප්‍රිය කලාවූ භික්ෂූන් කොටසකට මෙය ශාන්ත පරිසරයක් වුවාට නිසැකය. අද දවසේ පවා ඇතැම් භික්ෂූන් වහන්සේලා ආරාම වාසයට වඩා කඳුමත ලෙන්වල හා මහා වනාන්තරයෙහි වැඩ විසීමට කැමැත්ත දැක්වූහ. භික්ෂූන් වහන්සේලා මෙසේ වාසයට වඩාත්ම ප්‍රියකර ඇත්තේ ලෙණ භාවනානුයෝගී භික්ෂූන් වහන්සේලාට ඉතාමත් යෝග්‍ය වාසස්ථානයක් යැයි ආදි කාලයේ සිටම සැලකූ බැවිණි. මෙවැනි පරිසරයක් භික්ෂූන්ගේ භාවනාමය කටයුතු සඳහා ඉතාමත් යෝග්‍ය වුවාට නිසැකය. අතීතයේදී භික්ෂූන් වහන්සේලා තම ආගමික කටයුතු සඳහා ලෙන් විහාරාරාම භාවිතා කළ බවට පුරාවිද්‍යාත්මක සාධක අදටත් ශ්‍රී ලංකාව පුරාම දක්නට ඇති බව ද මෙයින් පැහැදිලි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


1. අමරසිංහ, මාලිංග, **සිතුල්පව්ව විහාරය**, ඡා ඇලඃ සමගි පොත් ප්‍රකාශකයෝ, 2005.

2. Alping, Mc, Guide to Ritigala, පරිවර්තනය. උදිත අලහකෝන්, ශ්‍රී ලංකාව ඃ මධ්‍යම සංස්කෘතික අරමුදල, 2002.

3. ගුණවර්ධන, ප්‍රිශාන්ත, **පුරාවිද්‍යාවඃ ශ්‍රී ලංකාවේ බහුජාතික එකමුතුව සහ වාස්තුවිද්‍යාව**, කොළඹඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2009.

4. ගුණවර්ධන, ප්‍රිශාන්ත, "සිතුල්පව්ව පුරාණ විහාරයේ වාස්තුවිද්‍යාව", **සිතුල්පව්ව,** පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, 1999.

5. චන්දානන්ද, මන්දාරම්නුවර, **රිටිගල උරුමය**. කර්තෘ ප්‍රකාශනයකි, 2017.

6. මේදානන්ද, එල්ලාවල, **ඓතිහාසික කුඩුම්බිගල.** කොළඹඃ දයාවංශ ජයකොඩි සහ සමාගම, 2005.

7. රාහුල, වල්පොල, **ලක්දිව බුදුසමයේ ඉතිහාසය**. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1999.

8. සෝමදේව, රාජ්, සහ අධිකාරි, ගාමිණී, "සිතුල්පව්ව විහාරය පිළිබඳ හැඳින්වීමක්", **සිතුල්පව්ව,** පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, 1999.

9. Adikaram,E.W, **Early History of Buddhism in Ceylon**, Colombo: M.D. Gunasena,1953

10. Bandaranayaka,S.,“ Sinhalese Monastic Architecture”, Sigiriya Project: **First Archaeological Excavation and Research Report (January-September1982)**UNESCO- Sri Lanka project of the Cultural Triangle, Colombo: The central Cultural Fund,1984.

11. Bell,H.C.P, **Annual Report of Archaeological Survey of Ceylon**, Colombo: Department of Archaeology, 1890-91.

12. Godakubura,C.E, **Annual Report of Archaeological Survey of Ceylon**, Colombo: Government Press, 1962-63.